
# ගොවි පුවත්

## කුකුලන් ඇතිකිරීම සහ රබර් වගාව

කුකුලන් ඇති කිරීමෙන් රබර් කිරි එලදාව වැඩිකර ගැනීමට හැකි බව පර්යේෂණ මගින් සොයා ගෙන ඇත. මේ අනුව රබර් වතුවල කුකුලන් ඇතිකිරීමෙන්, රබර් වගා කරුවන්ට ප්‍රයෝජනවත් වාසි කිහිපයක්ම ලබාගත හැකිය. එනම් අවුරුදු 1½ කින් පමණ රබර් ගසෙහි ලාබාල කාලය කෙටිකර ගත හැකි වන අතර වල් පැලෑටි මුලිම උදුරා දැමීම සහ පස සාරවත් කර ගැනීමටද උපකාර වෙයි.



## පොලිතීන් මලුවල සිටුවන ලද කොළ පැහැති අංකුර බද්ධ පැල මගින් රබර් පැලයේ ලාබාල කාලය අඩු කිරීම

රබර් කර්මාන්තයට මුහුණ පෑමට ඇති බරපතල අඩුපාඩුවක් වනුයේ බද්ධ පැල වලින් කිරි ලබාගැනීමට අවුරුදු 7 ක් හෝ ඊට වඩා වැඩි වූ දීර්ඝ කාලයක් ගතවීමයි. නිෂ්පාදනයක් සිදු නොකෙරෙන මෙම කාලය අඩු කිරීමට නොයෙකුත් ක්‍රම මගින් උත්සාහ දරා ඇත. අපේ කෘෂිදේශගුණික තත්වයන් යටතේ මෙම අරමුණ ඉටුකර ගැනීමට කොළ පැහැති අංකුර බද්ධ කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන ගැන නොයෙකුත් මත ඉදිරිපත් වී ඇත. මේ ක්‍රමය යොදා ගැනීමෙන් දුඹුරු පැහැති අංකුර බද්ධ කිරීමෙන් ලබාගන්නා පැලවලට වඩා අවුරුද්දක් අඩු කාලයකදී රබර් ගස්වලින් කිරි ලබාගැනීමට හැකි බව ඔප්පු වී ඇත.


පර්යේෂණයේදී 60X30 සෙ. මී. සහ 300 ක ඝණකම් ඇති පොලිතීන් මලු, වත්තේ මතුපිට ඇති හොඳ පසින් පුරවා ඒවායේ ග්‍රාහක පැල (Stock Plants) වවනු ලැබේ. මෙම බීජ පැල වලට මාස 5 ක් පමණ වන විට කොළ පැහැති අංකුර එයට බද්ධ කරයි. මාස 5 ක් පමණ කාලයක් වන විට එනම් පැල සිටුවන කාලය වන විට අනුජ (Scion) සෙ.මී. 60 – 70 පමණ උසට වැඩී කොළ වට දෙකකින් හෝ තුනකින් පමණ යුක්ත වේ. අග කොළ මේරූ පැල වත්තේ නැවත සිටුවනු ලැබේ. මින්පසු නිරීක්ෂණය සඳහා දුඹුරු අංකුර බද්ධ කරන ලද පැලද මේ සමග සිටුවනු ලැබේ.

පැල සිටුවා පලමු අවුරුද්ද ඇතුලතම කොළ පැහැති අංකුර බද්ධ කරන ලද පැල දුඹුරු පැහැති අංකුර බද්ධ කරන ලද පැල

වලට වඩා සීඝ්‍රයෙන් වැඩෙනු පෙනුණි. එමෙන්ම එම කොළ පැහැති අංකුර බද්ධ කරන ලද පැල කිරි කැපීමේ අවදියට, අවුරුද්දකට කළින් එළඹෙනු දකින්නට විය කිරි කැපීමේ අවදියට එළඹුනු නැති ගස් ප්‍රමාණයද සසැඳු විට ඉතා අඩු ප්‍රමාණයක් විය.

## කුඩා රබර් වතු වවන්නන්ට ලාභදායක අතුරු භෝගයක් ලෙස කෙසෙල්

දැනට කර ඇති පර්යේෂණ අනුව තෝරාගන්නා ලද ක්ලෝනයේ බද්ධ පැල මී 5x5 පරතරයක් ඇතිව පැල කරනු ලැබේ. ඉන් මාස 6 කට පසු මෙහිම, කෙසෙල් පැල අතර, මී 5×2 පරතරයක් ඇතිවන ලෙස, රබර් පැල පේලි දෙකක් අතරට කෙසෙල් පේලියක් වැටෙන සේ මාරුවෙන් මාරුවට කෙසෙල් අංකුර (මොට්) සිටුවිය යුතුය.



පර්යේෂණ අනුව කෙසෙල් අංකුර සිටුවා මාස 4 කට පසු, මාස 6 ක් අතර කාලය තුලදී මසකට වරක් 8:8:16 NPK මිශ්‍රණයේ ග්‍රෑම් 600 ක් පැලයකට වැටෙන සේ පොහොර යෙදිය යුතුය. මේ අතර පස් නොගැඹුරු ලෙස කෙටීමෙන්ද, වියලි ගිය අතු ගස මුල දිරාපත් වීමට ඉඩ හැරීමෙන්ද, පැලවලට සැරු යෙදීම ආදී සාමාන්‍ය ක්‍රියා පිළිවෙලක් ද අනුගමනය කල යුතුය. අවුරුද්දක් ආරම්භයේදී කෙසෙල් අංකුර සිටුවනු ලැබුයේ නම් ඒ වසරේ සිට මාස 2 ක් පමණ කාලයක් වනතෙක් කෙසෙල් කැන් නෙලීම කල හැකිය.

රබර් සිටුවීම සිදු කරන අවුරුද්ද තුල රනිල ආවරණ වගාවක් සිටුවීමටද මෙම කෙසෙල් වගා කිරීමේ ක්‍රියා වලියෙන් බාධාවක් සිදු නොවේ. එමනිසා රබර් වවන්නන්ට අතුරු බෝගය සහ ආවරණ වගාව යන දෙකෙන්ම ප්‍රයෝන ලබා ගැනීමට හැකිවේ.

## රබර් ලීය විදේශ විනිමය ලබාගැනීමේ ක්‍රමයක් ලෙස

රබර් ලියේ අගනා භාවය (Versatility) බොහෝ දෙනෙකු නොදත්තකි. මෙම මෘදු ලීය නොයෙකුත් මාදිලියේ ගෘහ භාණ්ඩ සාදා ගැනීම සඳහා ප්‍රයෝජනයට ගත හැකිය. මෙම ලීය ප්‍රයෝජනයට ගැනීමට පෙර පෝරනුවක දමා වේලා ගත යුතුය. මින්පසු අවශ්‍ය ප්‍රමාණයට කුඩා කොට ඒ ඒ අවශ්‍ය ප්‍රමාණයට අනුව වෙන් කරනු ලැබේ. කෘමි සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීමට කෘමි නාශක ආලේපයක් ගල්වා ගනු ලැබීමෙන් පසු තමන්ට අවශ්‍ය භාණ්ඩ සාදා ගැනීමට ප්‍රයෝජනයට ගත හැකි මෙන්ම විදේශ විනිමය ලබා ගැනීමට හැකි අගනා මාධ්‍යයක් ලෙසද මෙය පෙන්නුම් කළ හැකිය.